# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,915 - 2015 මැයි මස 15 වැනි සිකුරාදා - 2015.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 102 |


*සැ. යු.-* ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, සහ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූනි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/19371
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය :ඉ/7/දීබ/හිගු/119/(ඉ/6/3/2/138).

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බුබුල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බුබුල ගමේ අංක අ. ජ. පි. පො. 09 පිඹුරේ කැබලි අංක 153න් කොටසක් වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා දිසානායක මුදියන්සේලාගේ රනිල් ජයසුන්දර මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 154 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 154 ; |
| *දකුණට* | : | කැබලි අංක 154 ; |
| *බටහිරට* | : | කැබලි අංක 154. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට );

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2014.08.26 වැනි දින සිට වසර 5ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුකරය සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමිකම 2014.08.26 වැනි දින සිට වසර 5ක් ගත වීමෙන් පසුව හිමිවේ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

*(ඒ)* නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවාසේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමික සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 අප්‍රේල් මස 08 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-407/1

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/37654.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පීඑල්සී 3031716.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැදිරිගිරිය ග්‍රාම නිලධාරි වසමේ මැදිරිගිරිය ගමේ කැ. සි. 120064 කලාප 02 හි කැබලි අංක 146 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 පර්. 32 (හෙක්ටයාර් 0.1820) ක් වාණිජ කටයුතු සඳහා මැදිරිගිරිය ලංකා බැංකුව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 02 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 147; |
| *දකුණට* | : | කැබලි අංක 98 ; |
| *බටහිරට* | : | කැබලි අංක 140, 141, 142, 145. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2014.08.11 සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2014 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු පහකට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*වාර මුදල*.- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2013.04.04 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉකුත් වීමට කලින් පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් කළ නොහැක ;

(06) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. අයෝධ්‍යා එස්. ජයවර්ධන,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2013 අප්‍රේල් මස 08 වැනි දින,
"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-422

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/21354.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය : ඉ/6/3/2/268.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 46, ඒ තඹලවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජයන්තිපුර ගමේ අංක අ. ජ. පි. පො. 47 පිඹුරේ කැබලි අංක 581 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.096ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වගා කටයුතු සඳහා මහගල කොට්ටහච්චිගේ දොන් සතිස්චන්ද්‍ර මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 580; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 580 සහ 582 ; |
| *දකුණට* | : | කැබලි අංක 583 ; |
| *බටහිරට* | : | කැබලි අංක 583 සහ 418 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (1995.06.15 සිට ඉදිරියට) ;

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු පහකට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*දඩ මුදල*.- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි ;

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

(ඈ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වගා කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) 2013.03.06 වැනි දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 අප්‍රේල් මස 08 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-407/2

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/37308.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/2/SLO/45-Mission Purpose.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිලිනගර් ග්‍රාම නිලධාරි වසමේ කිලිනගර් ගමේ TSPP-34, Suppliment 19, Sheet - 24 පිඹුරේ කැබලි අංක 568 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0863ක් ග්‍රේස් රිඩෙම්ෂන් ෆෙලෝෂිප් පල්ලිය භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 568 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 568 ; |
| *දකුණට* | : | පාර (කැබලි අංක 569) ; |
| *බටහිරට* | : | කැබලි අංක 555. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*බදු කාලය .-* අවුරුදු තිහයි (30),(2015.04.08 සිට 2045.04.08 දක්වා) ;

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2015 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*(01)* මෙ ඉඩම ආගමික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(02) මෙමබද්ද ඇරඹුණ දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.;

*(03)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(04)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(05)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(06)* 2015.04.08 වැනි දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ;

*(07)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්*(වැ.බ .),*
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 අප්‍රේල් මස 23 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-408

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.